# දේශපාලන සන්නිවේදනය සහ ජනමත නිර්මාණය සම්බන්ධයෙන් පුවත්පත් කාටුන්වල බලපෑම

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ආර්.ඒ. මානෙල් ගීතානි*** [1]
***එම්.කේ.නදීකා දමයන්ත*** [2]

සංක්ෂේපය

පුවත්පත් කලාව ආරම්භ වී ඇති වූ දියුණුවත් සමඟ පාඨකයන්ගේ රුචිය වර්ධනය කිරීම සඳහා පුවත්පතට එක් වූ විවිධාංග අතර කාටුන් චිත්‍රයට හිමි වන්නේ මූලිකස්ථානයකි. පුවත්පත් කාටුන් චිත්‍රය වූ කලී සමකාලීන ගැඹුරු දේශපාලනික අර්ථයන් පාඨකයා වෙත සන්නිවේදනය කරන උපහාසය මුසු හාස්‍යෝත්පාදක කලාවකි. විශේෂයෙන්ම දෛනික පුවත්පත් සමඟ බැඳී පවතින මෙම දේශපාලන කාටුන් චිත්‍ර පාඨක රසඥතාව ඔප්නංවමින් ජනමත බිහි කරලීමට හේතු වී තිබේ. එම ප්‍රයත්නයේ දී සමකාලීන දේශපාලන චරිත හා සංසිද්ධීන් උපයෝගී කර ගනිමින් කිසියම් වූ දේශපාලනික පණිවුඩයක් මැනවින් පාඨකයන් වෙත සන්නිවේදනය කිරීමට ශ්‍රී ලාංකික පුවත්පත් කාටුන් චිත්‍ර ශිල්පීහු සිය අදහස් නිර්මාණශීලිව භාවිත කරමින් අදාළ පණිවුඩය සන්නිවේදනය කර තිබේ. පුවත්පත් මාධ්‍යයෙහි දේශපාලන කාටුන් චිත්‍ර මගින් දේශපාලන සන්නිවේදනය සඳහා කරනු ලබන බලපෑම කවරාකාර ද? යන්න විමසුමට ලක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතික දත්ත භාවිතා කෙරිණි. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදි. නියැදිය තෝරා ගැනීමේදී බහුපිය නියැදි ක්‍රමය යොදා ගැණිනි. ඒ අනුව පළමු පියවරේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතුරින් රත්නපුර දිස්ත්‍රික්කය අහඹු ලෙස තෝරා ගත් අතර දෙවැනි පියවරේදී දිස්ත්‍රික්කයේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 අතුරින් වැලිගෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අහඹු ලෙස තෝරා ගැණිනි. තෙවැනි පියවරේදී වැලිගෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් හතරක් ඇසුරින් ගම්මාන දොළහක් අහඹු ලෙස තෝරා ගනිමින් පුවත්පත් කියවන ජනතාව අතුරින් එක් පවුලකින් එක් පුද්ගලයෙක් බැගින් 100ක් තෝරා ගැණිනි. දත්ත විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක දත්ත සඳහා සරල සංඛ්‍යානමය විධික්‍රමද, ගුණාත්මක දත්ත සඳහා විස්තරාත්මක ක්‍රමවේදය ද භාවිතා කරන ලදි.

රටෙහි පවතින සමකාලීන දේශපාලන තත්ත්ව පිළිබඳ විමර්ශනයක දී පුවත්පත් කාටුන් චිත්‍ර මගින් අවබෝධයක් ලබා ගත හැකි බව ප්‍රතිචාරීන් 82%ක් අනාවරණය කළහ. එමෙන්ම පාඨක ජන විඥානය අවධි කර දේශපාලනමය වශයෙන් ජනමත බිහි කරලීමට කාටුන්වල පවතින ආකර්ෂණීය බව හේතු වන අතර කාටුන්වල පවතින සරල හා සිත් ඇද ගන්නා බව එයට ප්‍රධාන වශයෙන් බලපාන බව ප්‍රතිචාරීන් 49% ක් අනාවරණය කරන ලදි. මෙම අධ්‍යයනයේ දී අනාවරණය වු අනෙක් වැදගත් කරුණ නම් දේශපාලන කාටුන් සඳහා කැමැත්තක් දැක්වීමට හේතුව වන්නේ කෙටි කාලයකින් එහි අරුත අවබෝධ කර ගත හැකි වන නිසා බවයි. ප්‍රතිචාරීන්ගෙන් 55%ක් එම මතය දැරූහ.

ප්‍රමුඛ පදඃ කාටුන් චිත්‍ර, සන්නිවේදනය, පාඨකයා, පුවත්පත් කලාව, ජනමතය

1. ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය manelgeehansi@gmail.com
2. ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය